www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සීඝ්‍ර වර්ධනයට පිටුපසින් එක්සත් ජනපද දළ දේශීය නිෂ්පාදිතයේ දත්ත අනාවරනය කරන අඳුරු ආර්ථික තත්වය

## Behind rapid growth, US GDP figures reveal bleak economic situation

ඇන්ඩ්‍රි ඩේමන්
2010 පෙබරවාරි 2

2009 සිව්වන කාර්තුවේ එක්සත් ජනපද ආර්ථිකය, වාර්ෂිකව සියයට 5.7 ක අනුපාතයකින් වර්ධනයවූ බව වාර්තා විය. වානිජ්‍ය දෙපාර්තමේන්තුව ජනවාරි 29 දින නිකුත් කල දල දේශීය නිෂ්පාදිතයේ (දදේනි) මූලික දත්ත පෙන්නුම් කලේ, වසර හයක් තුල වාර්තාවූ වේගවත්ම ආර්ථික අනුපාතය එය බවයි.

එහෙත්, එක්සත් ජනපදය සිටින්නේ මැතම සංඛ්‍යා මගින් පෙන්වනවාට වඩා බෙහෙවින් නරක තත්වයක බව ආර්ථික විශාරදයන් අනතුරු ඇඟවීමත් සමග එකී ජයග්‍රාහිත්වය ඉක්මනින්ම හීතියක් බවට පත්විය.

රිජ් වර්ත් ඉන්වෙස්ට්මන්ත්හි ඇලන් ගයිල් නිව්යෝක් ටයිම්ස් පුවත්පතට ප්‍රකාශ කල පරිදි ''දදේනි වාර්තා මතුපිටින් දීප්තිමත් හා නවමු ආකාරයකින් පෙනේ. එහෙත් ආවරනය ඉවත් කල වහාම ඔබට පෙනෙන්නේ එය පිටතින් පෙනෙන තරමටම අනර්ග නොවන බවයි.''

දදේනි වර්ධන අනුපාතය ආර්ථික විශේෂඥයින් බලාපොරොත්තු වූ සියයට 4.7 ට වඩා සියයට එකකින් වැඩි අගයකි. කෙසේ නමුත්, ජනවාරි 29 දින වෙලඳපොල වසන අවස්ථාවේ ඩව් ජෝන්ස් කාර්මික දර්ශකයේ සාමාන්‍යය සියයට 0.5කින්ද නැස්ඩැක් අගය සියයට 1.5කින්ද පහත බැස තිබුනි.

දදේනි වර්ධනයෙන් වැඩි පංගුව ''කාර්මික භාන්ඩ තොගය ආපසු පැනීමට'' අදාලව සිදුවූ අතර, එය සමාගම් තම භාන්ඩ වලින් ගුදම්ගත කරනු ලබන තොග අඩු කිරීමේ අනුපාතය පහත හෙලනු ලැබීම නිසා හටගත් තත්වයකි. මෙවැනි වර්ධනයක් ආර්ථික පහත වැටීමකට පසුව එන කාලානුකූල සිද්ධියක් වන අතර, එය ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ පෙර ඇඟවුමක් වන්නේ ඊට සමගාමීව පාරිභෝගික වියදම් ද ඉහල යන්නේ නම් පමනි. එහෙත් තත්වය එසේ නොවේ.

තෙවන කාර්තුව තුල භාන්ඩ තොගය ඩොලර් බිලියන 139.2 කින් පහත හෙලීමෙන් පසුව සමාගම්, සිව්වන කාර්තුවේ සිය තොගය අඩුකලේ බිලියන 33.5 කින් පමනි.

එකී වෙනස ආර්ථිකයේ මුලු ''වර්ධනය වූ සියයට 5.7න් සියයට 3.4 කටම දායක විය. වසර 1946 න් පසුව එක දිගට කාර්තු හයක්ම පැවති නාමික දදේනි වර්ධනයෙහි හැකිලීම සැලකිල්ලට ගත් විචාරකයින් සඳහන් කලේ, ඓතිහාසික සම්මතයන් අනුව මැතම ''තොගවල පිටතට පැනීම'' දුර්වල තත්වයක පවතින බවයි.

පාරිභෝගික වියදම් සැබවින්ම නරක අතට හැරෙන තතු තුල, භාන්ඩ තොග වෙනස් වීමෙන් වර්ධනයට ඇතිකල දායකත්වය අත්හල විට, ඇතිවූ ආර්ථික වර්ධනය බොහෝ කොටම නොසැලකිය හැකි තරම්ය. මෙය පාරිභෝගිකයන් විසින් දහනය කල ප්‍රකෘතිමත් වීමක් නොව ඔවුන්ගේ වියදමෙන් අත්කරගත්

දෙයකි. වැටුප් අඛන්ඩව පහත වැටුන අතර සමාගම්, ඉතිරිකරගත් ශ්‍රමිකයන්ගෙන් තව තවත් ශ්‍රමය මිරිකා ගනු ලැබින.

වාර්ෂික අනුපාතයකින් පාරිභෝගික වියදම් වල වැඩිවීම, තෙවන කාර්තුවේ සියයට 2.8 ක සිට සිව්වන කාර්තුවේදී සියයට 2 දක්වා අඩුවී තිබේ. අනෙක් අතට, පාරිභෝගික භාන්ඩ මිල ගනන්. වාර්ෂික අනුපාතයකට අනුව අවසාන තෙමස තුල සියයට 3.2 න් ඉහල යාමත් සමඟ ගත් කල, පාරිභෝගික වියදම් මූර්ත අගය, සැබවින්ම නම් පහත ගොස් තිබේ.

පුද්ගලික හා රාජ්‍ය  යන දෙඅංශයේම කම්කරුවන් මත වැඩ වේගවත් කිරීමේ කොන්දේසි පනවා තිබේ. ඩෙට්‍රොයිට් නගරවාසී එක් කම්කරුවෙක් පසුගිය සමිති රැස්වීමකදී ප්‍රකාශ කලේ, ''මම වසර ගනනක සිට මැනික් කටුවේ ආබාධයකින් පෙලෙනවා. ඒත් ලඟදි හඳුන්වා දුන් නිවාඩු දින වල වැඩකිරීම හා වැඩ වේගවත් කිරීමේ ක්‍රම නිසා දැන් මට ශල්‍යකර්මයක් කිරීමට සිදුවී තියෙනවා. ඔබට දැක ගැනීමට හැකියි, බොහෝ දෙනා වෛද්‍ය නිවාඩු ලබා ගනිමින් තියෙන බව; මේ කඩිනම් කිරීමේ ක්‍රම අපව දිරාපත්කර  හරිනවා.''

මෑතකම පලවූ නිෂ්පාදන පලදායිතාවය පිලිබඳ දත්ත මෙම අත්දැකීම සනාථ කරයි. අලුත්ම සංඛ්‍යා ලේඛන ලබාගත හැකිව තිබෙන අවසන් කාර්තුව තුල නිෂ්පාදන පලදායිතාව සියයට 8.1 ක අනුපාතයකින් වර්ධනය වී තිබේ.

දදේනි දත්ත එලි දැක්වූ දිනයේම කම්කරු දෙපාර්තමේන්තුව නිකුත් කල අලුත්ම ශ්‍රම දත්ත වලට අනුව, වේතනවල සැලකිය යුතු වැටීමක් දක්නට ඇත. වසරකට පෙර වේතනවල ඇතිව තිබූ වර්ධන වේගයවූ සියයට 2.6 ට සාපේක්ෂව දෙසැම්බර් දක්වා වූ මාස 12 ක කාලය තුල වේතන ඉහල ගියේ සියයට 1.5 කින් පමනි.

එහෙත්, උද්ධමනයට ගැලපූ කල වේතන අගය සැබවින්ම නම් සියයට 1.2 කින් පහත වැටී තිබේ.

දැනටත් සිදුවෙමින් ඇති රැකියා අහිමිවීම මඟින් වැඩ වේගවත් කිරිම හා වැටුප් කප්පාදුව උග්‍ර අතට පත්කර තිබේ. 2009 සිව්වන කාර්තුව තුල එක්සත් ජනපද ආර්ථිකයේ රැකියා 208,000ක් අහිමි වී ගිය අතර රැකියා අනුපාතය සියයට 9.7 සිට සියයට 10 දක්වා ඉහල නැගී ඇත. උග්‍ර සේවා වියුක්ති තත්වය අඩු පාරිභෝගික වියදම් වලට සෘජුවම දායකවී තිබේ.

සිව්වන කාර්තුවේ ආර්ථික ප්‍රකෘතිය මඟින්, එක්සත් ජනපදයේ වසර 63 ක් තුල සිදු වූ ලොකුම වාර්ෂික හැකිලීම ආවරනය කර තිබේ.

මෑතකම එලි දැක් වූ සංඛ්‍යා දත්ත තව දුරටත් සැලකිය යුතු පරිදි සංශෝධනය වීමට නියමිත අතර නිශ්චිත සංඛ්‍යා දත්ත  ලැබෙනු ඇත්තේ මාර්තු මාසය වන විටයි. ආන්ඩුව තෙවන කාර්තුවේ වර්ධන අගය මුලදී දැක්වූයේ සියයට 3.5 ක් ලෙස නමුත් පසුව එම අගය සියයට 2.2 දක්වා පහත දමමින් සංශෝධනය කෙරින.

2010  සඳහා ආර්ථික වර්ධනය සියයට 3 කටත් වඩා අඩු වනු ඇති බව බොහෝ සමීක්ෂන පුරෝකථනය කරයි. එහෙත් අධි ධාරිතා අර්ශාස්ත්‍රය ඇතුලු සෙසු ආයතන දක්වන පරිදි වර්ධන වේගය සියයට 1 ක් තරම් දක්වා පහත වැටිය හැකිය. අයිඑන්ජී ආයතනයේ ජේම්ස් නයිට්ලි *ෆිනෑන්සියැල් ටයිම්ස්* පත්‍රයට ප්‍රකාශ කලේ ''මෙවැනි වර්ධන වේගයක් (සිව්වන කාර්තුවේ මෙන්,) නය අර්බුදයෙන් පසුව ඇතිවූ තත්වයන් යටතේ පවත්වාගෙන යා නොහැකි'' බවයි.

මැත සංඛ්‍යා දත්ත පිලිබඳව වඩාත් අශුභවාදී තක්සේරුව නිකුත් කලේ බ්ලූම්බර්ග් ඩොට් කොම්හි කෙවින් හැසට් විසිනි. ''කාර්තුවකට දදේනි වර්ධන වේගය සියයට 6 ක ප්‍රතිශතයක් පෙන්නුම් කිරීම අසුභ ප්‍රවෘත්තියක් වූයේ කවදා ද? පසුගිය සතියේ වාර්තාවූ වෙනස්කම් සැලකිල්ලට ගත් කල්හි එසේ වන්නේය.''

හැසට් මෙසේ සඳහන් කලේය, බඩු තොග ඉහල නැංවීම් ''2010 සඳහා භයානක ඇඟවුම් ගෙන එනු ලබයි. මන්ද යත්, උත්පාතයන් අනෙක් අතට ආර්ථික සිහිමූර්ජා වීමද ඇති කරන බැවිනි. ප්‍රකෘතිකරනය පිලිබඳ පූර්ව නිරීක්ෂනයන් අනුව, උත්පාතයකට පසුව එන කාර්තුවේ සාමාන්‍ය වර්ධන අනුපාතය සියයට 0.9 කි; මෙය සියයට 5.7 ට වඩා විශාල වශයෙන් අඩු සොච්චම් අගයකි. උත්පාතයකට පසුව එන දෙවන කාර්තුවේදී සාමාන්‍ය වර්ධන අනුපාතය හුදෙක් සියයට 1.6 ක් පමනි.''

ඔහු තවදුරටත් සඳහන් කලේ, ''මේ කරුනු සලකා බලමින් අපට කිව හැක්කේ, බඩු තොගවල උත්පාතයකට පසුව වර්ධනය තුල අප අත්විඳින්නේ, ඊට ගැලපෙන පහත වැටීමක් පමනක් නම් අප වාසනාවන්ත බවයි. එහිදී, 2010 පලමු කාර්තුවේ වර්ධන වේගය ශුන්‍යයට ඉතා ආසන්න අගයක් ගනු ඇත. එසේ සිදුවුවහොත් දෙපැත්තකින් බැට දෙන පසුබෑමක් පිලිබඳ කතිකාවක් මතු වනු ඇත. සමහර විට එවැනි කතා දැන්ම පටන් ගත හැකිය'' යනුවෙනි.

© www.wsws.org